**නාවික සංවර්ධන අරමුදල - 2016**

**--------------------------------------------**

නාවික සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය ව්‍යාවනය**

-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**2.2.1 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

-------------------------------

1973 අංක 26 දරන ශ්‍රී ලංකා නැව් ඉඩපහසුකම් වෙන්කිරීමේ මධ්‍ය කාර්යාංශ පනත යටතේ නැව් නියෝජිතයන් ගෙන් අයකළ ගාස්තු හා කොමිස් මුදල් උපයෝගීකර ගනිමින් අරමුදල පිහිටුවා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන ගොස් ඇතත් 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස නෛතික පසුබිමක් සහිතව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. 2011 මැයි 24 දිනැති අංක පීඊ/සීඕපී/(4)31ජීඊඑන් දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියේ උපදෙස් අනුව 2011 වර්ෂයේදී අරමුදලේ පැවති මුදලින් රු.මිලියන 46.47ක් නව මගී පර්යන්තයක් පිහිටුවීම සඳහා ආයෝජනය කිරීමට සීමාසහිත ලංකා නැව් සංස්ථාවට මුදාහැරීමෙන් පසු අරමුදලේ පැවති ඉතිරි මූල්‍යමය වත්කම් සියල්ල උපලබ්ධිකර 2011 හා 2012 වර්ෂවල අවස්ථා 3ක දී ඒකාබද්ධ අරමුදලට බැරකිරීමෙන් පසු කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදුකර නොතිබුණි. එබැවින් අරමුදලේ අඛණ්ඩ පැවැත්මක් නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

අරමුදලින් ජනාධිපති කාර්යාලයට හා අධ්‍යාපන අමාත්‍යාංශයට පිළිවෙලින් ලබාදී තිබූ රු.366,691,764 ක හා රු.946,095 ක මුදල් සම්බන්ධව කිසිදු සනාථ කිරීමේ ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ලබාදී තිබූ රු.55,000,000 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබාගත් බැවින් එය සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වගකීමක් නොවන බවත් විගණනය වෙත වාර්තාකර තිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ලෙස පෙන්නුම් කෙරෙන සමස්ථ වටිනාකම වූ රු. 422,637,859 ක් සඳහා ශේෂ සනාථ නොලැබීම හා අදාළ ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස නොදැක්වීම මත මුදල් අයවීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

2011 වර්ෂයේ සිට අරමුදලේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශයක් හෝ සමුච්චිත අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයක් සකස් කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1. කාර්යසාධනය**

----------------

2006 වර්ෂයේදී නැව් නියෝජිතයන්ගෙන් ගාස්තු හා කොමිස් මුදල් අයකිරීම අධිකරණ නියෝගයක් මගින් තහනම් කිරීම නිසා අරමුදලට ආදායම් ලැබීම නතරවී තිබුණි. තවද, ණයගැතියන් හැර අනෙකුත් සියලුම වත්කම් 2011 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගයක් මත මහා භාණ්ඩාගාරයට පවරා දීමෙන් පසු අරමුදලේ සියලුම මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබුණි. 2014 නොවැම්බර් 05 දිනැති රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ගේ ලිපිය අනුව අරමුදලේ ඉතිරි වී ඇති රාජ්‍ය ආයතන වෙත ලබාදෙන ලද අත්තිකාරම්, කපාහැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු බව දැනුම් දී තිබුණත් අමාත්‍යාංශය විසින් එවැනි අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.